ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
ඉඩම් මහලේකම් කාර්යාලය, නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
காணி செயலகம், இல: 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
Land Secretariat, No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

# දැන්වීමයි.

## උතුරු සහ නැගෙනහිර පළාත්වල රජයේ ඉඩම් ගැටළු විදීමේ විශේෂ කඩිනම් වැඩපිළිවෙල

## (උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම)

ගැටුම්කාරී වාතාවරණය නිමවීමෙන් පසුව උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාව මුහුණ දී සිටින රජයේ ඉඩම් සම්බන්ධ ගැටළු කඩිනමින් විසඳා අවසන් කිරීමේ විශේෂ වැඩසටහනක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් එම පළාත්වල ඉඩම් කොමසාරිස්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේද ,දිසාපතිවරුන්ගේද සහයෝගය ඇතිව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

ඔබ උතුරු හෝ නැගෙනහිර පළාත තුළ -:

- ✓ රජයේ ඉඩමක් නීත්‍යානුකූල ලෙස භුක්ති විදි හෝ දැනටමත් භුක්ති විදින අයෙක්ද?
- ✓ රජයේ ඉඩමක් අනවසරයෙන් භුක්ති විදි හෝ දැනටමත් භුක්ති විදින අයෙක්ද?
- ✓ රජයේ ඉඩමක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර තිබූ හෝ අපේක්ෂාවෙන් සිටි එම පළාත්වල පදිංචි කරුවෙක්ද?

එසේනම් අදාළ ඉඩම් සම්බන්ධයෙන් ඔබ විසින් මුහුණ දී ඇති යම් ගැටළුවක් පවතීද?

- ❖ ඔබේ ගැටළුව ඔබේ ඉඩම පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මගින් හෝ සෘජුවම හෝ තැපැල් මාර්ගයෙන් හෝ ඉඩම් පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන්න.
- ❖ ඒ සඳහා භාවිතා කළ යුතු නියමිත ආකෘති පත්‍රයක් ග්‍රාම නිලධාරීගෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ලබාගන්න.
- ❖ මෙම ආකෘතිපත්‍රය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන්ද (www.landcommdep.gov.lk) බාගත කිරීමෙන් ලබා ගත හැක.
- ❖ ඔබේ ගැටළුව භාරගත්බවට ලියාපදිංචි අංකයක් සමග ලදු පතක් ඔබ වෙත නිකුත් කරනු ඇත.
- ❖ ඔබේ ගැටළුව විසඳීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය පියවර ගනු ඇත.

- ඔබ වෙත දැන්වූ විට ඒ සඳහා අවශ්‍ය සියළුම සහාය ලබා දෙන්න.
- ඔබ වෙත නිකුත් කළ අංකය සෑම විමසීමකදීම භාවිතා කරන්න.

මේ පිළිබඳ වැඩිදුර විස්තර උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම හෝ උතුරු හා නැගෙනහිර පළාත්වල පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලවලින් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ උතුරු නැගෙනහිර ඒකකයෙන් හෝ විමසා දැන ගත හැකියි. ඊට අමතරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇති අංක 2013/01 දරන චක්‍රලේඛය හෝ එම වෙබ් අඩවියේ සඳහන් මීට අදාළ දැන්වීම පරිශීලනය කිරීමෙන්ද වැඩි විස්තර දැනගත හැකිය.

ආර්.පී.ආර්.රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල් මාවත,
බත්තරමුල්ල.